Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of



01) පාඩම හෝ ඒකකය - සංගීත ශිල්පීන් (පණ්ඩිත් රවී ශංකර් මහතා)

02) ඉගෙනුම් ඵල -

- පණ්ඩිත් රවී ශංකර් මහතාගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.
- පණ්ඩිත් රවී ශංකර් සංගිතය ක්ෂේත්‍රයට ලබාදුන් සුවිශේෂී මෙහෙය අගය කරයි .
- පණ්ඩිත් රවී ශංකර් දක්ෂතා පෙන් වූ සංගීත භාණ්ඩය නම් කරයි.
- පණ්ඩිත් රවී ශංකර් මහතා නිර්මාණය කළ කෘති නම් කරයි.
- පණ්ඩිත් රවී ශංකර් දක්ෂතා පෙන් වූ විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරයි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- E නැණ පියස සාමාන්‍ය පාඩම් සහ අන්තර්ජාලය උපයෝගී කරගෙන පණ්ඩිත් රවී ශංකර් මහතා පිළිබඳ තොරතුරු ගවේශනය කරන්න.
- අන්තර්ජාලය ඔස්සේ එතුමාගේ නිර්මාණය නරඹා රස විඳින්න.

1) පණ්ඩිත් රවී ශංකර් මහතාගේ ජීවන තොරතුරු විස්තර කරන්න.

2) පණ්ඩිත් රවී ශංකර් සංගිතය ක්ෂේත්‍රයට ලබාදුන් සුවිශේෂී මෙහෙය අගය කරන්න.

3) පණ්ඩිත් රවී ශංකර් දක්ෂතා පෙන් වූ සංගීත භාණ්ඩය නම් කරන්න.

4) පණ්ඩිත් රවී ශංකර් මහතා නිර්මාණය කළ කෘති නම් කරන්න.

5) පණ්ඩිත් රවී ශංකර් දක්ෂතා පෙන් වූ විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කර ඒවා විස්තර කරන්න.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

### පණ්ඩිත් රවි ශංකර්



1920 අප්‍රේල් 07 වන දින සොහොයුරන් 07 දෙනෙකුගෙන් යුත් බ්‍රාහ්මණ පවුලක බාල සොහොයුරා ලෙස බරණැස දී උපත ලැබූ මොහු රබින්ද්‍ර ශංකර් චෞද්රි නම් විය. 20 වන ශතවර්ෂයේ මැද භාගයේ දී ලොව පහළ වූ විශිෂ්ටතම සිතාර් වාදකයා ලෙස මොහු හැඳින්වෙයි. සිතාර් වාදනය පිළිබඳ ව ඉහළ ම නිපුණතාවට පත් ඉන්දීය සංගීතඥයකු ලෙස මෙතුමාට 'පණ්ඩිත' යන සංගීත ගෞරව නාමය හිමි විය. එතැන් පටන් මෙතුමා 'පණ්ඩිත් රවි ශංකර්' නමින් ලොව පතළ විය.

තරුණ වියේ දී මොහු තම සොහොයුරකු වූ උදය ශංකර්ගේ නැටුම් කණ්ඩායම සමග යුරෝපයේ සහ ඉන්දියාවේ සංචාරවල නිරත විය. 1938 දී ඔහු නර්තනය අතහැර දමා සංගීතඥ අලව්දීන් ඛාන් යටතේ සිතාර් වාදනය පුහුණු කරන්නට විය. 1939 දී ඔහු ප්‍රසිද්ධියේ සිතාර් වාදනය ඉදිරිපත් කිරීම ආරම්භ කළේ ය. 1944 වසර වන විට සංගීත අධ්‍යාපන කටයුතු අවසන් කළ මොහු ඉන්දීය මහජන සිනමා සංගමයට එක් විය. එහි දී ගීත රචකයකු හා සංගීත නිර්මාණකරුවකු ලෙස සත්‍යජිත් රායි ගේ චිත්‍රපටවල පසුබිම් සංගීත නිර්මාණයෙහි නිරත විය. එමෙන් ම 1949 - 1956 කාලය තුළ මෙතුමා 'ඕල් ඉන්ඩියා' ගුවන් විදුලි සේවාවෙහි සංගීත අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරමින් ඉන්දීය ජාතික වාදක මඩුල්ල සඳහා සංගීත නිර්මාණ කළේ ය.

1960 දී මෙතුමා ප්‍රකට වයලීන් වාදකයකු වූ යෙහුදි මෙනුහින් (Yehudi menuhin) සහ බීට්ල්ස් (Beatles) සංගීත කණ්ඩායමේ ගිටාර් වාදකයකු වූ ජෝර්ජ් හැරිසන් (George Harrison) සමග එක් ව බටහිර සංගීතය සමග සිතාරය නිර්මාණාත්මක ව මුසු කරමින් ප්‍රසංග ඉදිරිපත් කරන්නට විය.

1970 - 1980 දශක වන විට මෙතුමා බටහිර සංගීතය සමග සිතාරය මුසු කරමින් වාදක මණ්ඩලය සඳහා සංගීත රචනා කරමින් එම කණ්ඩායම් සමග ලොව වටා සංචාරයෙහි ද නිරත විය. එතුමාගේ අරමුණ වූයේ ඉන්දියානු සංගීතය ලොව පුරා ප්‍රචලිත කිරීම යි.

1986 සිට 1992 තෙක් ඉන්දීය පාර්ලිමේන්තුවේ පත් කළ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ මෙතුමා 1999 දී ඉන්දියාවේ ඉහළ ම ගෞරවය වන 'භාරත රත්න' නාමයෙන් පිදුම් ලැබීය. ඉන්දියානු නොවන චිත්‍රපට සඳහා සංගීතය නිර්මාණයට ද යොමු විය. 1970 සිට මෙතුමා ඉන්දීය සංගීතය පිළිබඳ ආරාධිත දේශකයකු ලෙස කැලිෆෝනියා විශ්ව විද්‍යාලයයෙහි සේවය කළේය. මෙතුමා 'My music 1968, Learning Indian music - 1979 , Raga mala' - 1997 යන කෘති රචනා කරමින් මතු පරපුර වෙත දායාද කළේය.

1941 වසරේ දී මොහු අලව්දීන් ඛාන්ගේ දියණියන් වන අන්නපූර්ණා දේවි සමග විවාහ විය. 1942 දී මෙ දෙපළට 'සුබේන්ද්‍ර ශංකර්' නමින් පුතෙක් ලැබිණ. පසු කලෙක සුබේන්ද්‍ර ශංකර් ද දක්ෂ සිතාර් වාදකයකු ලෙස ප්‍රකට වූ අතර ඔහු ද තම පියාගේ සංචාර සඳහා සහභාගී වී ඇත. ශංකර් තම අවසාන ප්‍රසංගය තම දියණියන් වන අනුෂ්කා සමග 2012 නොවැම්බර් 04 වන දින කැලිෆෝනියාවේ 'Terrace' රංග පීඨයේ දී පැවැත්විය. 2012 දෙසැම්බර් 06 වන දින ශ්වසන ආබාධයක් හේතුවෙන් එතුමා කැලිෆෝනියාවේ 'Scripps memorial' රෝහලට ඇතුළත් කරන ලදී. 2012.12.11 දින හදවත් සැත්කමකින් අනතුරු ව සුවහසක් රසික සිත් කම්පාවට පත් කරමින් මෙලොවින් සමු ගත්තේ ය.

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=6CYcSnm9sIA
  https://www.youtube.com/watch?v=GEy89EKhXm8

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත, සෞන්දර්ය අධ්‍යාපන දෙපාතර්මේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.